ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 අගෝස්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 අගෝස්තු මස 21 වන දින]

එල්. ඩී.— ඕ. 22/2005.

### 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1956 අංක 47 දරන පනතට 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 20අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"වයස අවුරුදු 18 ට අඩු තැනැත්තන් උපද්‍රවකාරී රැකියාවල සේවයේ නියුක්ත කිරීමට එරෙහිව ඇති තහනම.

20අ. (1) වයස අවුරුදු දහඅටකට අඩු කිසිම තැනැත්තෙක්, (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් මාර්ගෝපදේශවලට අනුව නියම කරනු ලබන යම් උපද්‍රවකාරී රැකියාවක, සේවයේ නියුක්ත කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උපද්‍රවකාරී රැකියා නියම කිරීමේ දී, කරනු ලබන රැකියාවේ ස්වභාවය හෝ ඒ රැකියාව කරගෙන යනු ලබන්නේ යම් අවස්ථාවන් යටතේ ද, එකී අවස්ථාවන් (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට එම රැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු විය හැකි හානියද, අමාත්‍යවරයා විසින් සැලකිල්ලට ගත යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු සේවයේ නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා

දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකටද, නැතහොත් එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු අතර, ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදලක් ද ගෙවන ලෙස ආඥාවක් කරනු ලැබිය යුතු ය.”

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල, භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.